

ගලීනා ලේබෙදෙවා

නිදී නැති හන්දා

ගලීනා
ලේබෙදෙවා

නිදි නැති හන්දා

සී/ස, ප්‍රෝග්‍රෙසිව් පබ්ලිෂිං හවුස් (පුද්) සමාගම

නිදි නැති හන්දා

ගලීනා ලේබෙදෙවා

ISBN 978-955-1319-90-8

මුද්‍රණය

Kanol PRINT

ප්‍රකාශනය

සී/ස, ප්‍රෝග්‍රෙසිව් පබ්ලිෂිං හවුස් (පුද්.) සමාගම
91, ආචාර්ය අන්.ඇම්. පෙරේරා මාවත, කොළඹ 08

ප්‍රථම මුද්‍රණය 2019



මාෂාගේ අම්මා කොට්ට මෙට්ට පිළියෙළ කරලා ඇඳ හදලා, මාෂා නිදි කරවල අල්ලපු ගෙදරට ගියා.

මාෂා ඇඳේ වැතිර හිටියට නිදා ගත්තේ නැහැ. වරක් ඇට රස්නෙයි වගේ. කොට්ටය ගොරෝසුයි වගේ, තව වරක් කොට්ටය බොහොම උසයි වගේ. ආයෙමත් කොට්ටය බොහොම පහතයි වගේ. මාෂාට තරහ ආවා. මිට මොළවල කොට්ටෙට ගැහුවා.

“අපෝ හරිම නරක, ගොරහැඬි, කොට්ටයක්!”

ඊට පස්සෙ පෙරවන ඇඳ රෙද්දට පයින් ගැහුවා. ඒක බිමට ඇද දමලා මෙහෙම කිව්වා.

“අපෝ කටු රෙද්දක් වගේ, පෙරවාගන්න බැහැ!”

ඇඳෙන් බිමට බැහැලා අඩි පොළොවේ ගසලා කෑගැහැව්වා.

“හැමදාම රෑට නිදාගන්න මට බැහැ. මේ ඇඳ ඇතිවෙලා! හරිම කම්මැළියි!”

සෙරෙප්පු දෙක දමාගෙන මාෂා හෙමිහිට කාමරයෙන් එළියට ආවා. ගෙයි දොර අගුළු දාලා වහලා නැහැ. පොඩ්ඩක් දොර ළඟ හිටගෙන ඉඳලා මාෂා ගෙදරින් එළියට ගියා. පඩිපෙළ දිගේ ගෙවත්තට ආවා.



"නිදා නොගන්න එක හරි හොඳයි! හරිම හොඳයි!" කිය කියා තනි කකුලෙන් උඩ පැන පැන නැටුවා.

ඔහොම පැන පැන ගිය මාෂා බලු කූඩුව ළඟට ආවා. කූඩුව ඇතුළෙ හිටිය බලුහාමි කතා කළා.

"හව්, හව්, ඔතන කවුද?"

"ඒ මම, මාෂා"

"හොඳටම රෑ වෙලා ඇයි නිදාගන්නෙ නැත්තේ?"

"මගේ ඇඳ හොඳ නැහැ. මම ඇඳට බැන්නා, සැරවුණා. ඒ ඇඳේ නිදන්න මට බැහැ."

"හරියට හරි. නිදාගන්න හොඳම තැන තමා මගේ බලු කූඩුව. පිදුරු ගොඩේ ගුළි ගැහිලා සනීපෙන් නිදන්න පුළුවන්. හොඳ ලස්සන හීනත් පෙනේවි!"

"ආ! කොච්චර හොඳද!" මාෂා සතුටු වුණා.

මාෂා දණගාමින් බලු කූඩුවට රිංගලා පිදුරු ගොඩට වෙලා නිදා ගන්න හැදුවා. කූඩුව හිරයි, පුංචියි. පිදුරු ගස් ඇගේ ඇනෙනවා. බලුහාමි මස් කටුවක් කටින් අරගෙන කූඩුවට හොම්බ ඇතුළු කරනවා.

"මාෂා, මෙන්න මස් කටුවක්. ඔය කටුව ලෙව කකා නිදාගන්න. එතකොට හොඳට නින්ද යාවි," කියලා ඌ කිව්වා.

"බලුහාමි නුඹට බොහොම ස්තුතියි. නුඹේ කූඩුව හරි හොඳයි. හැබැයි නිදාගන්න මට බැහැ" කියලා මාෂා යන්න ගියා.

"අපෝ මාෂා හරිම කරදරකාරියක්!" කියලා අමනාප වුණු බලුහාමි කිව්වා.







ඊට පස්සෙ මාෂා කුකුළු කූඩුවෙ වයිරන් කිකිළි වයිරන් බිත්තරයක් දැම්මද හොයල බලන්න ගියා. මාෂා දොරෙන් එබිකම් කළා විතරයි, රතු කුකුළා අත් අඬු ගහලා මාෂාගෙන් මෙහෙම ඇහුවා.

"ආවෙ මොකට ද?"

"අනේ රතු කුකුළො, මම ආවෙ වයිරන් කිකිළි වයිරන් බිත්තර දැම්ම ද කියල හොයල බලන්න" කියලා මාෂා කිව්වා.

"නුඹ හරිම ඉක්මන්කාරියක්! වයිරන් කිකිළි හැමදාම සුදු බිත්තර දානවා. ඒ වුණාට වයිරන් බිත්තර දාන්නේ ඉඳ හිටල. නුඹ ගෙදර ගිහින් නිදාගනින්."

"මට බැහැ"


"මොකද බැරි?"

"මම ඇඳට බැන්නා. සැරවුණා. ඒ ඇඳේ නිදාගන්න බැහැ"

"අපේ කුකුළො ලගින කෝටුව බොහොම හොඳා. ඔය කෝටුව උඩ ලැගලා එකිනෙකාට කිට්ටුවෙලා පිහාටු පුම්බගෙන නිදා ගන්නව. එතකොට හොඳට නින්ද යනවා! සැප තමා!"

මාෂා බොහොම අමාරුවෙන් සතුන් ලගින හරස් කෝටුවට නැග ගත්තා. කකුල් තද කරගෙන, වකුටු වෙලා ඉඳ ගත්තා. වම් පැත්තේ වයිරන් කිකිළි. දකුණු පැත්තේ රතු කුකුළා. උන්ගෙ පිහාටු හන්දා මාෂාට උණුහුමක් දැනුණා. ඉතින් ඈට නිදිමත හැදුණා. එකපාරක් මාෂා නිදිකිරා වැටුණා විතරයි බිම ඇද වැටුණා.





මාෂා කුකුළු කූඩුවෙන් එළියට පැනලා දුවගෙන දුවගෙන ගිහිල්ලා ගෙදර එළිපත්තෙ වාඩි වුණා. එතකොට මොකෙක්දෝ කුරුල්ලෙක් වහලෙට උඩින් පියාඹලා මාෂාගේ දණහිස උඩ වැහුවා. හරිම අපූරු කුරුල්ලෙක්.

"ආයුබෝවන් නුඹ කවුද?" කියලා මාෂා ඇහුවා.

"මම වවුලෙක්. දවල්ට නුඹලගෙ අට්ටාලෙට වැදිල නිදා ගන්නවා. රෑට පියාඹනවා. ඇයි ළමයා නුඹ නිදාගන්නෙ නැත්තේ?"

"මම ඇඳට බැන්නා, සැර වුණා"

"මට නුඹ ගැන කනගාටුයි. මම නුඹට උදව් කරනවට නුඹ කැමතිද?"

සන්තෝෂ වුණ මාෂා "කැමතියි!" කියල කිව්වා.

"එහෙනම් නැගපන් අට්ටාලයට" වවුලා මාෂාට කියලා සිදුරක් අස්සෙන් පියාඹලා අට්ටාලයට ඇතුළු වුණා.

මාෂා ඉණිමගක් ගෙනල්ලා අට්ටාලයට නැග්ගා.



"මෙන්න මගේ නිදන කාමරය" කියල වවුලා කිව්වා.

"නුඹේ ඇඳ කොහිද?"

වවුලා හිනාවෙලා මෙහෙම පිළිතුරු දුන්නා. "මට නිදාගන්න ඇඳක් ඕන නැහැ. මෙන්න මේ පරාලෙ යකඩ ඇණයක් හයියෙන් අල්ලාගෙන, ඔළුව බිමට හරවා ගත්තම මට බොහොම හොඳට නින්ද යනවා. නුඹ අට්ටාලයට වරෙන්. මගේ හොඳම ඇණය තේරා ගන්න මම නුඹට අවසර දෙනවා!"

කුකුළු කූඩුවෙ නිදාගන්න ගිහිල්ලා වුණු දේ ගැන මාෂාට කල්පනා වුණා. හීරුණු දණහිස අතගෑවා.

"මම කොහොමද වවුලා වගේ නිදාගන්නේ? ඔළුව බිමට හරවාගෙන, මාව බිම වැටේවි! මෙතැන නිදාගන්න බැහැ...." කියලා මාෂා සිතුවා.

"මාෂා කොහෙද?" වවුලා මාෂාව හොයන්න පටන් ගත්තා.

මාෂා පිළිතුරු නොදී, ශබ්ද නොකර ඉණිමග දිගේ පහළට බැස්සා. ගෙවත්තේ වැටෙන් රිංගලා ඈ ගියා පොකුණ ළඟට. බය වුණු ගෙම්බෝ බක බක ගෑම නවත්තලා වතුරට පැනලා හැංගුණා. මහලු කොකාත් බයවෙලා අත් අඬු ගැසුවා.

පොකුණට ඇවිත් ඉන්නෙ පුංචි ළමයකු බව දුටු කොකා සන්සුන් වෙලා කතා කළා.

"ඈ ළමයෝ, නුඹ මොකද මගෙ ගෙම්බන්ව බය කරන්නේ?"

"මට නින්ද යන්නෙ නැති හන්දා"

"හා-හා-හා! මම හිතා හිටියෙ නාකි මට විතරයි නිදාගන්න බැරි කියලා. හැම තිස්සෙම පොකුණ ළඟට වෙලා ඉන්න හන්දා මට රක්ත වාතෙ හැදිල හන්දිපත් රිදෙනව. උඹට නිදාගන්න බැරි මොකද?"



"හැමදාම රෑට නිදාගන්න මට බැහැ. නිදාගන්න හිතක් නැහැ."

"නිදාගැනීම එතරම් හිත සතුටු කරවන වැඩක් නොවේ. නුඹ මගෙ පඳුර ළඟට වරෙන්. මගේ අත් අඬුවලින් මම නුඹව උණුසුම් කරන්නම්. බඩගිනි වුණාම නුඹට ගෙම්බන් අල්ලා දෙන්නම්. එක කකුලකින් හිටගෙන මා වාගේ නිදා ගනින්" කියලා කොකා ඈට කිව්වා.

"මම ගෙම්බන්ට බයයි. වතුර හරිම සීතලයි. නුඹ වගේ නිදා ගන්න මට බැහැ!"

"නාකි මට කරදර නොකර පලයන් යන්න. නුඹ නැති වුණාට මට තියෙන සීතල ඇති!" කියල කොකා මාෂාව එළවා ගත්තා.



මාෂා කල්පනා කළා.

"ගෙම්බො ඉන්න පොකුණ ළඟ සීතලේ කොහොමද මම නිදා ගන්නෙ. දැන් ඇඳට ගිහිල්ලා උණුහුමට පොරවාගෙන නිදා ගන්න ඇත්නම්. කොට්ටෙ නපුරු නැහැ. හරි හොඳයි. කරුණාවන්තයි. බොහොම සිනිඳුයි."

මාෂා නැවත ගෙදර ගියා.

ශබ්ද නොකර දෙපයේ ඇඟිලි තුඩුවලින් ගෙතුළට ඇවිත්, බිම දමා ගිය පොරවන රෙද්ද ආපහු අහුලාගෙන, කොට්ටෙ හරි ගස්සල ඇඳට නැගලා නිදා ගන්න ලෑස්ති වුණා.

මාෂාට දැන් හොඳටම නිදිමතයි.

"කොහොම වුණත් මගේ ඇඳ තරම් හොඳ ඇඳක් කාටවත් නැහැ!" කියලා මාෂා කීවා.



ගලීනා ලේබෙදේවා

නිදී නැති හන්ද



ISBN 978-955-1319-90-8

සී/ස ප්‍රගති ප්‍රකාශන නිවස
91, ආචාර්ය ඇන්. ඇම්. පෙරේරා මාවත, කොළඹ 08

Rs. 150/-